## 8. වත්ථාරම්මණ පුරේජාත නිස්සය ප්‍රත්‍යයේ ත්‍රිරාශිය

වත්ථාරම්මණ පුරේජාත නිස්සය ස්වරූපයෝ ප්‍රත්‍ය, ප්‍රත්‍යයෝත්පන්න, ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වෙති.

මරණාසන්න කාලයෙහි ච්‍යුති චිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදින හෘදය වස්තු රූපය වත්ථාරම්මණ පුරේජාත නිස්සය ප්‍රත්‍යය වේ.

මනෝද්වාරාවර්ජනය ය, කාමජවන් එකුන්තිස ය, තදාරම්මණ එකොළොස ය, අභිඥා දෙසිත ය, ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ච ය, විචිකිච්ඡා, විරති, අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සිවුසාළිස ය යන මොවුහු වත්ථාරම්මණ පුරේජාත නිස්සය ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

වත්ථාරම්මණ පුරේජාත නිස්සය ප්‍රත්‍යය නො ලබන්නා වූ ද නො ලබන අවස්ථාවෙහි වූ ද එකුන්අනූ චිත්ත ය, චෛතසික දෙපණස ය, චිත්තජ රූප ය, ප්‍රතිසන්ධි කර්මජ රූප ය, බාහිර රූප ය, ආහාරජ රූප ය, ඍතුජ රූප ය, අසංඥ සත්ත්ව කර්මජ රූප ය, ප්‍රවෘත්ති කර්මජ රූප ය යන මොවුහු වත්ථාරම්මණ පුරේජාත නිස්සය ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීකයෝ ය.

---

**ප්‍රත්‍යය -** "වත්ථු + ආරම්මණ + පුරෙජාත + නිස්සය" යැයි පද සතරකට බෙද ගත යුතු වේ. යම් ධර්මයක් 1. වස්තු රූපයක් වීම ද 2. ප්‍රත්‍යයෝත්පන්නයන්ගේ ආරම්මණය වීම ද 3. ප්‍රත්‍යයෝත්පන්නයන් පහළ වීමට පෙර පහළ වී ස්ථිති ක්ෂණයට පැමිණ සිටීම ද 4. නිස්සය ශක්තියෙන් ප්‍රත්‍යය වීම ද යැයි කරුණු සතරකි. මෙම කරුණු සතරින් යුක්ත වූ ධර්මය නම් හදය වස්තුව යි. එබැවින් ප්‍රත්‍ය ධර්මයන් සඳහා හෘදය වස්තුව උද්ධරණය කළ යුතු ය යන්න නිශ්චිත ය. එසේ වුව ද මෙහි ස්වරූපාර්ථ ගැනීමේදී මරණාසන්න හෘදය වස්තුව පමණක් උද්ධරණය කරන්නා වූ ද, මරණාසන්න හෘදය වස්තුව සහ ප්‍රකෘති හදය වස්තුව යන දෙක ම උද්ධරණය කරන්නා වූ ද යනුවෙන් ආචාර්යවාද දෙකකි.

ඒ අතරින් මරණාසන්න හෘදය වස්තුව පමණක් උද්ධරණය කරන පළමු ආචාර්යවාදයේ අදහස නම් - යම් හෘදය වස්තුවක් යම් සිතක් විසින් නිස්සය කෙරේ ද, ඒ සිත ඒ හෘදය වස්තුව ම අරමුණු කළ යුතුය. එසේ වුවහොත් පමණක් "හෘදය වස්තුව නිස්සය ද වේ, ආරම්මණය ද වේ" යන ලක්ෂණයට ගැලපේ. මරණාසන්න අවස්ථාවේ දී මනෝද්වාරාවර්ජන ආදී සිත් චුති සිතෙන් මත්තෙහි

දහහත්වැනි සිත සමඟ ඉපදුණු හෘදය වස්තුව නිශ්‍රය කරගනියි. ස්වකීය ප්‍රත්‍යයෝත්පන්න වූ හෘදය වස්තුව අරමුණු කරමින් අනිත්‍යාදී වශයෙන් විදර්ශනා කරනා විට ද, හෘදය වස්තුව ආස්වාද කරනා විට ද, හෘදය වස්තුව පිළිකුල් කරනා විට ද, විචිකිච්ඡා, උද්ධච්ච පහළ කරන විට ද මරණාසන්න ජවනයන් ඇරඹුණහොත් ඒ මනෝද්වාරාවර්ජනාදී වීථි චිත්තයෝ අවසානයට ඉපදුණු හදය වස්තුව ම අරමුණු කරති. මෙසේ වූ කල්හි නිශ්‍රය සහ අරමුණ යන දෙක ම වන පරමාර්ථ ධර්මය නම් මරණාසන්න හදය වස්තුව ම ය.

මරණාසන්න නොවන ප්‍රකෘති අවස්ථාවේ දී පෙර පෙර සිත හා සමඟ ඉපදුණු හෘදය වස්තුව පසු පසු සිත විසින් නිස්සය කරනු ලබයි. එම පෙර පෙර සිත සමඟ ඉපදුණු හෘදය වස්තුව පසු පසු සිත මඟින් එකකට පසුව එකක් අරමුණු කළ නොහැකි ය. එසේ කළ හැකි වී නම් එක් චිත්ත වීථියක් තුළ දී අරමුණු එකිනෙකට වෙනස් වේ. මනෝද්වාරාවර්ජනයෙන් යොමු කරන ලද (ආවර්ජිත) අරමුණ ද පසු පසු සිත් මඟින් නොකඩවා නොගන්නා තැනට පත් වේ. විස්තර දක්වන්නෙමි - පෙර පෙර සිත් සමඟ ඉපදුණු හදය වස්තුව නිස්සය ද අරමුණු ද වුවහොත් භවඞ්ගුපච්ඡේදය සමඟ ඉපදුණු හෘදය වස්තුව මනෝද්වාරාවර්ජනය විසින් යොමු කරනු ලබන අතර (ආවර්ජනය කරනු ලබන අතර), ප්‍රථම ජවනය විසින් මනෝද්වාරාවර්ජනය සමඟ ඉපදුණු හෘදය වස්තුව අරමුණු කරනු ලබයි. මේ ආදී වශයෙන් මනෝද්වාරාවර්ජනය යොමු කරන අරමුණු ජවනය විසින් නොගනු ලබයි. පෙර සිතෙහි අරමුණ සහ පසු සිතෙහි අරමුණ අසමාන වේ. මාර්ග වීථි සහ ඵල සමාපත්ති වීථි ආදී විශේෂ චිත්ත වීථීන් හැර සාමාන්‍ය චිත්ත වීථි වල මෙසේ ආවර්ජනයාගේ අරමුණ අඛණ්ඩව නොගැනීමක් නොමැත. වීථි සිත් එකිනෙකාගේ අරමුණුවල ද භේදයක් නැත. මෙසේ ප්‍රකෘති අවස්ථාවේ හෘදය වස්තුවේ නිශ්‍රය සහ අරමුණ යන දෙක ම එක්වර ඇති වීමට හැකියාවක් නොමැති බැවින් පූර්වාචාරීන් වහන්සේලා මෙම වත්ථාරම්මණ පුරේජාත ප්‍රත්‍යය සඳහා මරණාසන්න හදය වස්තුව පමණක් උද්ධරණය කර දක්වූහ.

**දෙවන ආචාර්ය මතය -** පට්ඨානසාරදීපනී පරමත්ථදීපනී ආදියෙහි - "ප්‍රකෘති අවස්ථාවේ දී ද ඇතැම් විටක හෘදය වස්තුව නිස්සය ද අරමුණ ද වේ" යන අදහස ගැනෙයි. ඒ ආචාර්යයන් වහන්සේලාගේ අදහස දක්වන්නෙමි - වර්තමාන හෘදය වස්තුව අරමුණු කරමින් විදර්ශනා හා ආස්වාදාදිය කරන විට මනෝද්වාරාවර්ජනය විසින් හෘදය වස්තුව ආවර්ජනය කරනු ලබයි. පසු පසු ජවනයෝ ද හෘදය වස්තුව ම අරමුණු කරති. කුහුඹු රැළක්

පෙළට යන්නාක් මෙන් සන්තති ප්‍රඥප්ති වශයෙන් එකීභූතව ඇති හදය වස්තු සන්තතියෙහි එක් එක් හෘදය වස්තුවක් වෙන් කරමින් අරමුණු කළ නොහැකි ය. මනෝද්වාරාවර්ජනයේ පටන් පසු පසු ජවනයන් විසින් සාමාන්‍ය හෘදය වස්තුව නිස්සය ද කරගනු ලබයි, අරමුණ ද කරගනු ලබයි. මෙසේ වූ විට නිස්සය ද අරමුණ ද හෘදය වස්තුව වීම හේතුවෙන් ප්‍රකෘති කාලයේ හදය වස්තුව ද ඇතැම් විට වත්ථාරම්මණ පුරෙජාත නිස්සය ප්‍රත්‍යය වේ යැයි එම ආචාර්යයන් වහන්සේලාගේ අදහස යි.

**ප්‍රත්‍යයෝත්පන්න** - ප්‍රත්‍යයෝත්පන්න සඳහා ස්වරූපාර්ථ ගැනීමේ දී අභිඥා ඇතුළත් විය යුතු ද නැද්ද පිළිබඳව වාදයක් ඇත. "අභිඥා වීථිය මරණාසන්න වීථි වල නූපදියි, මරණාසන්න වීථි වල නූපදී නම් අභිඥා සිත විසින් එකවර හදය වස්තුව නිශ්‍රය ද අරමුණ ද නොකර ගනියි" යැයි අදහසක් ඇත. එසේ වුවද මරණාසන්න අභිඥා වීථි පහළ විය හැකි බව පිළිබඳ වීථි භාෂා ටීකාවේ දක්වූ අතර එය මෙම ප්‍රථම වාදයට පක්ෂ නොවේ. 'අභිඥාව ලැබේ ය' යන වාදයෙහි කවර අභිඥාවක් ලැබේද යන්න විමර්ශනය කළ යුතු වේ. දිබ්බචක්ඛු ආදී අභිඥා වර්තමාන රූපාරම්මණාදිය අරමුණු කිරීම හේතුවෙන් ඒ අභිඥාවෝ නො ලැබේ. ඉද්ධිවිධ අභිඥා ස්වකීය කරජ කාය අරමුණු කරයි, කරජ කායෙහි හෘදය වස්තුව ඇතුළත් වේ. එබැවින් ඉද්ධිවිධ අභිඥාව ම පමණක් ලැබේ. ස්වකීය හෘදය වස්තුව අරමුණු කරන විට, මරණාසන්න අභිඥා වීථි පහළ වෙද්දී මනෝද්වාරාවර්තනය පරිකර්ම, උපචාර, අනුලෝම, ගෝත්‍රභූ, අභිඥා චිත්තයන්ගේ නිස්සය ද අරමුණ ද හදය වස්තුව වන බැවින් වත්ථාරම්මණ පුරෙජාත නිස්සය ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නය වේ යැයි අදහස් කෙරේ. (පරමත්ථදීපනියෙහි මෙම අදහසට අනුව ප්‍රවෘත්ති අභිඥාවන් ද ප්‍රත්‍යයෝත්පන්න වේ යැයි කියූ බව දත යුතු.)

අභිඥා සහ ප්‍රවෘත්ති අවස්ථාවේදී ද මෙම ප්‍රත්‍යය ලැබේ ය යනු අදහස ඇති ආචාර්යයන් වහන්සේලාට අනුව ස්වරූපාර්ථයන් මෙසේ සංශෝධනය කරනු ලබයි.

"නිශ්‍රය ද අරමුණ ද වන අවස්ථාවේ දී වර්තමාන හෘදය වස්තුව වත්ථාරම්මණ පුරේජාත නිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වන්නා වූ ධර්මයෝ වෙත්. වත්ථාරම්මණ පුරේජාත නිස්සය ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවේ දී මනෝද්වාරාවර්ජන ය, කාම ජවන් එකුන්තිස ය, තදාරම්මණ එකොළොස ය, අභිඥා දෙසිත ය, ඉස්සා, මච්ඡරිය කුක්කුච්ච, විචිකිච්ඡා, විරති, අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සිවුසාළිස ය යන මොවුහු වත්ථාරම්මණ පුරේජාත නිශ්‍රය ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය."

චෛතසික සම්ප්‍රයෝගය දක්වීමේ දී ස්වකීය හෘදය වස්තුව අරමුණු කරමින් ඉස්සා, මච්ඡරිය, කුක්කුච්ඡ, විචිකිච්ඡා පහළ නො වේ. හෘදය වස්තුව ව්‍යතික්‍රමණ කටයුතු වස්තුවක් ද නො වේ. සත්ත්ව ප්‍රඥප්තියක් ද නො වේ. එබැවින් විරති අප්පමඤ්ඤාවෝ ද හෘදය වස්තුව අරමුණු නො කරත්. තවද ඉස්සා ආදී චෛතසිකයන් අත්හළ යුතුය. ප්‍රත්‍යනීකයන් සඳහා ස්වරූපාර්ථයන් විශේෂයෙන් සංශෝධනය කිරීමක් අවශ්‍ය නැත. "වත්ථාරම්මණ පුරේජාත නිස්සය ප්‍රත්‍යය නො ලබන්නා වූ ද නො ලබන අවස්ථාවෙහි වූ ද" යන්නෙහි 'නො ලබන අවස්ථාවෙහි වූ ද' යන වාක්‍ය ඛණ්ඩය මනෝද්වාරාවර්ජන ආදිය අපේක්ෂා කරමින් කියන ලද්දකි. ප්‍රත්‍යය ලබන්නා වූ අවස්ථාවේදී ප්‍රත්‍යයෝත්පන්න වන අතර ප්‍රත්‍යය නොලබන අවස්ථාවේ දී ප්‍රත්‍යනීක වේ යැයි අදහස් කෙරේ. 'වත්ථාරම්මණ පුරේජාත නිස්සය ප්‍රත්‍යය නො ලබන්නා වූ' යනු ඒකාන්තයෙන් ප්‍රත්‍යය නොලබන්නා වූ ද්විපඤ්ච විඤ්ඤාණ මනෝධාතු ත්‍රිකය සහ අභිඥා හැර අර්පණා ජවනයෝ අපේක්ෂා කරමින් දක්වූවකි. එම ධර්මයෝ ඒකාන්ත ප්‍රත්‍යනීකයෝ වෙත්.

## ප්‍රශ්න

1.

2. “”